**මහනුවර මහා නගර සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**--------------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 12 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 30 දින ද නගරාධිපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මහනුවර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ස්ථාවර තැන්පත් පොලී රු.2,936,596 ක් ආදායමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | වරිපනම් ආදායම් රු.452,984 ක් වැඩියෙන් හඳුනා ගෙන තිබුණි. | ආදායම් නිවැරදිව හඳුනාගත යුතුවේ. | පරීක්ෂා කර ඉදිරියේ දී පිළිතුරු ලබා දීමට කටයුතු කරමි. |
| (ඇ) | විථි බදු ආදායම් රු.400,000 ක් වැඩියෙන් හඳුනාගෙන තිබුණි. | නිවැරදිව ආදායම හඳුනාගත යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | ජල ආදායම් රු.8,362,283 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ආදායම හඳුනාගත යුතුවේ. | ඉදිරියේ දි නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | ආදායම් විෂය 50322(iii) ට අදාළව ලැබිය යුතු රු.8,613,070 ක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | මෝටර් රථ හා කරත්ත වටිනාකම රු.77,329,450 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි අගයන් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී ලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (උ) | එකතුව රු.5,098,811 ක් වූ ගෙවිය යුතු ණය වාරික හා පොලි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දි ගැලපීම් සිදු කිරීමට කටයුතු කරමි. |

**1.3.2** <u>නොසැසඳුනු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 06 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපලේඛන අතර රු.80,961,300 ක නොසැසඳීමක් විය. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කළ යුතුවේ. | පරීක්ෂා කර කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරමි. |

**1.3.3** <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | <u>ලැබිය යුතු ගිණුම්</u><br>අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.40,643,751 ක් විය. | ලැබිය යුතු මුදල් අය කළ යුතුවේ. | ඉදිරියේ දී හිඟ මුදල් අය කිරීම හා අනෙකුත් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | <u>ගෙවිය යුතු ගිණුම්</u><br>අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.38,328,935 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුවේ. | ඉදිරියේ දි ගෙවීම් නිරවුල් කර විගණනයට වාර්තා කරමි. |

**1.3.4** <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම තොරතුරු ඉදිරිපත් නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.26,134,498 ක් වූ ගබඩා ණය හිමි ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ශේෂ සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | අදාළ තොරතුරු පරීක්ෂා කර ඉදිරියේ දි ක්‍රියාමාර්ග ගනිමි. |

**1.3.5 අනුකූල නොවීම**

**1.3.5.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මු.රෙ.1646 | වාහන 135 කට අදාළව ලොග් සටහන් පොත් පවත්වා ගෙන ගොස් නොතිබූ අතර, වාහන සඳහා යොදන ලද ටයර් පිළිබඳ විස්තර ලොග් පොත් තුළ සටහන් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුවේ. | කාර්ය මණ්ඩල ඌනතාවය නිසා, මෙම කාර්යය ප්‍රමාද වී ඇති අතර, ඉදිරියේ දි නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | වෙනත් චක්‍රලේඛ | | | |
| (i) | පළාත් පාලන කොමසාරිස්ගේ (මධ්‍යම පළාත) චක්‍රලේඛ අංක 2016/03 හි | | | |
| | • 05 ඡේදය | මහා නගර සභාව සතු ටොරිංටන් හා කැප්පෙටිපොල වෙළඳ සංකීර්ණයේ කඩ කුලි වසර 05 කට වරක් තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව, කටයුතු කළ යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇතත්, මෙතෙක් පිළිතුරු ලැබී නොමැත. |
| | • 5(ii)ඡේදය | මධ්‍යම වෙළඳ පොල කඩ කාමර සඳහා 2016 වර්ෂයේ සිට නව තක්සේරුගත කුලිය වාර්ෂිකව සියයට 25 ක් බැගින් වැඩි කිරීමට සභාව සම්මත කර තිබුණ ද, ඒ සඳහා වූ කොන්දේසිය ගිවිසුම්වලට ඇතුළත් කර නව ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව, කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දි නිවැරදිව ගිවිසුම්ගත වීමට කටයුතු කරමි. |
| | • 06 වගන්තිය | කැප්පෙටිපොල හා මැණික්කුඹුර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 107 කින් නව තක්සේරුව මත පදනම්ව බදු කුලි අය කර නොතිබූ අතර, ජෝර්ජ් ඊ. ද සිල්වා වෙළඳ සංකීර්ණයේ නව තක්සේරුව මත බදුකරුවන් සමඟ නව ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ වෙළඳ සංකීර්ණ සඳහා නව තක්සේරු මුදල් ගෙවන ලෙස දන්වා ඇති අතර, ඉදිරියේ දි අදාළ ක්‍රියාමාර්ග ගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2011 ජූනි 13 දිනැති පීඑල්/10C/01/11 අංක දරන පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති ලිපිය හා මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය | මහා මාර්ගයට යාබදව ඉදිකරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් අය නොකර, සභා සම්මුතියක් මත ගාස්තු අය කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පුවරුවේ ප්‍රමාණය මත අය කළ යුතු මුදල පමණක් මහා සභාවට යොමු කර අනුමැතිය ලබා ගන්නා බව ප්‍රකාශ කරමි. |
| (iii) | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 39/40 වගන්තියෙන් බලය දී ඇති හා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගේ 1/99, 1/2002 හා 13/2006 චක්‍රලේඛය | පළාත් පාලන සේවයේ යෙදී සිටිය දී මියගිය අයගේ දරුවන් සඳහා විවෘත කර, මහා නගර සභාව භාරයේ රඳවා ගෙන ඇති බාල වයස්කාර දරුවන් 15 දෙනෙකුගේ ගිණුම් පොත් නිදහස් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තොරතුරු හෝ ලිපිනයන් ලිපිගොනුවෙන් සොයාගත නොහැකි අතර, ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.6** <u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උද්‍යාන අංශය සඳහා තණ පිඩලි මිල දී ගැනීමට අදාළව මිල ගණන් කැඳ වූ නිවේදනය අනුව, සැපයුම්කරු පිඩලි ප්‍රවාහනය කිරීම සිදු කළ යුතු වුව ද, සභාව විසින් පිඩලි ප්‍රවාහනය කිරීම සිදු කර, ඉන්ධන ලීටර් 1,418.5 ක් සඳහා රු.147,524 ක් දරා තිබුණි. | ටෙන්ඩර් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිඩලි ප්‍රවාහනය සඳහා අනුමැතිය ලබා ගත් අතර, සභාවට වාසිදායක ලෙස ප්‍රවාහන කටයුතු සිදු කර ඇත. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.609,888,349 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.586,748,840 ක් විය.

### 2.2 <u>මූල්‍ය පාලනය</u>

බැංකු ගිණුම් 02 කට අදාළ 2019 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් පරීක්ෂා කිරීමේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නිකුත් කර තිබූ නමුත්, ගෙවීමට ඉදිරිපත් නොකළ රු.1,013,488 ක් වටිනා චෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව, කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ආදායමට ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පසුගිය වර්ෂ 06 තුළ තැන්පත් කළ නමුත්, උපලබ්ධි නොවූ රු.1,903,095 ක් වටිනා චෙක්පත් හා මුදල් ඇණවුම් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කඩිනමින් පරීක්ෂා කර විගණනයට වාර්තා කරමි. |
| (ඇ) | සෘජු බැර බැංකු තැන්පතු රු.1,600,453 ක් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | කරුණු සොයා බලා විගණනයට වාර්තා කරමි. |
| (ඈ) | සෘජු හර කිරීම් රු.152,488 ක් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | බැංකුවෙන් විමසීම් කර අදාළ තොරතුරු විගණනයට වාර්තා කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 933,118,000 | 753,074,508 | 879,044,931 | 277,247,237 | 878,245,000 | 731,472,381 | 634,109,151 | 252,948,621 |
| (ii) | කුලී | 626,128,000 | 132,727,171 | 119,186,633 | 112,966,348 | 123,276,000 | 119,538,223 | 112,010,789 | 74,296,012 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 51,422,000 | 47,114,983 | 47,114,983 | -- | 51,854,100 | 46,569,841 | 46,568,941 | -- |
| (iv) | වෙනත් ආදායම් | 689,704,000 | 620,876,524 | 620,876,524 | -- | 615,797,000 | 607,869,074 | 484,052,597 | 806,186,283 |
| | එකතුව | 2,300,372,000 | 1,553,793,186 | 1,666,223,071 | 390,213,585 | 1,669,172,100 | 1,505,449,519 | 1,276,741,478 | 1,133,430,916 |

### 2.3.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වරිපනම්<br>2019 දෙසැම්බර් 31 දිනට අය විය යුතු රු.179,335,183 ක වරිපනම් බදු අය කර නොතිබුණි. | වරිපනම් බදු අය කළ යුතුවේ. | ඉදිරියේ දී අය කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ඉඩම් බදු<br>2019 දෙසැම්බර් 31 දිනට අය විය යුතු රු.18,810,429 ක් වූ ඉඩම් බදු අය කර නොතිබුණි. | හිඟ ඉඩම් බදු අය කළ යුතුවේ. | ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ජල බදු<br>මැණික්කුඹුර වෙළඳ සංකීර්ණ වැසිකිළි පද්ධතිය සඳහා අය විය යුතු රු.630,363ක ජල ගාස්තු අය කර නොතිබුණි. | හිඟ ජල බදු අය කළ යුතුවේ. | ඉදිරියේ දී අය කිරීමට කටයුතු කරමි. |

**2.3.3** <u>කුලී</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සංචාරක තොරතුරු මධ්‍යස්ථානය සඳහා බිල් කළ රු.600,000 ක ආදායම රැස් කර නොතිබුණි. | ආදායම් ඉපයීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දි අදාළ මුදල් අය කරමි. |
| (ආ) | මධ්‍යම වෙළඳ පොල හා වෙනත් නාගරික වෙළඳපොලවල්වලින් කඩ කුලී හා ටෙන්ඩර් ගාස්තු ලෙස ලැබියයුතු රු.41,250,668 ක් අය කර නොතිබුණි. | ආදායම් අය කර ගත යුතුවේ. | නව තක්සේරු අනුව බිල් කිරීම් නිසා, හිඟය වර්ධනය වී ඇත. |
| (ඇ) | මැණික්කුඹුර වෙළඳපොලෙන් ලැබියයුතු රු.12,939,958 ක් වූ කුලී මුදල් අය කර නොතිබුණි. | කුලී මුදල් අය කළ යුතුවේ. | නව තක්සේරුව මත බිල් කරන නමුත්, පැරණි කුලිය ගෙවන බැවින්, හිඟ මුදල වර්ධනය වී ඇත. |
| (ඇ) | 2011 වර්ෂයේ සිට පැවත එන රු.20,917,165 ක් වටිනා දුම්රියපොළ පාර වෙළඳ සංකීර්ණයේ එක්වන් මුදල අය කර නොතිබුණි. | එක්වන් මුදල් අය කළ යුතුවේ. | 2020 වර්ෂයේ දි අය කිරීමට කටයුතු කරමි. |

**2.3.4** <u>වෙනත් ආදායම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2009 වර්ෂයේ සිට පැවත එන රථ ගාලෙන් අයවිය යුතු රු.200,567,833 ක ආදායමක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | අය විය යුතු මුදල් අය කළ යුතුවේ. | නඩුවක් පවතින අතර, ඉදිරියේ දි තීන්දුව ප්‍රකාරව කටයුතු කරමි. |
| (ආ) | වීථි බඳු දීම හෙවත්, රථ වාහන නැවතීමේ ගාස්තු ලෙස අයවිය යුතු රු.9,131,623 ක් අය කර නොතිබුණි. | හිඟ මුදල් අයකළ යුතුවේ. | අදාළ ආයතනය විසින් වරින් වර හිඟ මුදල් ගෙවමින් පවතී. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.23,329,769 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු ආදායම අය කර නොතිබුණි. | හිඟ මුදල් අයකළ යුතුවේ. | ඉදිරියේ දි අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.3.5** <u>උසාවි දඩ</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,072,900 ක් වී තිබුණි. | ලැබිය යුතු මුදල් අය කළ යුතුවේ. | ඉදිරියේ දි අය කර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ----------- | --------------------------------- |
| | වැඩසටහන් 05 ක් සඳහා වෙන් කළ රු.26,000,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | ප්‍රතිපාදන මුදල් අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතුවේ. | අදාළ කාර්යයන් වර්තමානය වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------- | --------------------------------- |
| (අ) | පේරාදෙණිය පාරේ පිහිටි ගොඩනැගිල්ල සඳහා සපයා තිබූ ජල සැපයුමට අදාළව අයවිය යුතු රු.194,963 ක හිඟ මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකළ යුතුවේ. | ඉදිරියේ දි අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ග්‍රාම නිලධාරී කාර්යාල පවත්වා ගෙන යාම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී තිබූ ගොඩනැගිලි 07 ක් සඳහා ගිවිසුම් කාලය ඉක්මවා අවුරුදු 02 ක් ගත වන තුරු නව ගිවිසුම්වලට එළඹ නොතිබූ අතර, බදු දී තිබූ ගොඩනැගිලි 05 ක් සඳහා මහා නගර සභාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ වලංගු ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | වලංගු ගිවිසුම්වලට එළඹිය යුතුවේ. | ඉදිරියේ දි අවශ්‍ය කටයුතු සිදු කරමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------- | ----------------------------------- |
| (අ) | සේවක පුරප්පාඩු හා අතිරික්ත<br>----------------------------------- | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට සේවක පුරප්පාඩු 275 ක් හා අතිරික්ත තනතුරු 03 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුවේ. | ඉදිරියේ දි පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවක ණය<br>--------------- | | |
| | නගර සභාවේ සේවය කර මිය ගිය, විශ්‍රාම ගිය හා ඉවත්ව ගිය සේවකයන්ගෙන් අය විය යුතු රු.2,630,460 ක ණය ශේෂයක් අයකර නොතිබුණි. | ණය ශේෂ අය කළ යුතුවේ. | ඉදිරියේ දි නිලධාරින්ගෙන් හෝ ඇපකරුගෙන් අය කරමි. |

**3.4** <u>**මෙහෙයුම් අකාර්යක්ෂමතා**</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | -------------------------------- |
| (අ) | දේපළ බදු දීම සම්බන්ධ අඩුපාඩු<br>------------------------------------- | | |
| (i) | කැප්පෙටිපොල වෙළඳ සංකීර්ණයේ පහත මහලේ කඩ කාමර දීර්ඝ කාලයක සිට වසා දමා තිබූ අතර, කඩ කාමර 34 කින් රු.1,221,291 ක කඩ කුලිය වසර 02 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | හිඟ මුදල් අය කිරීමට හා කඩ කාමර කුලියට දීම කළ යුතුවේ. | වෙළඳ සංකීර්ණය අලුත්වැඩියා කර, බදුකරුවන් වෙත ලබා දීමට කටයුතු කරමි. |
| (ii) | මැණික්කුඹුර සිල්ලර වෙළඳ සංකීර්ණයේ පවතින කඩ කාමර 31 කින් වර්ෂ 02 කට වැඩි කාලයක සිට රු.3,394,294 ක මුදලක් හිඟ හිටව තිබූ අතර, කඩ කාමරවල සන්තකය ලබා ගැනීමට හෝ අන් ක්‍රමයකින් හිඟ කුලි අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කළ යුතුවේ. | කඩ කාමර 13 ක සන්තකය පවරා ගෙන ඇති අතර, දැනට අලුත්වැඩියා කටයුතු සිදු වෙමින් පවතී. |
| (iii) | ජෝර්ජ් ඊ. ද සිල්වා වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 11 ක වසරකට වඩා වැඩි හිඟ හිටි කඩ කුලි ශේෂය රු.1,618,875 ක් වූ අතර, කඩ කාමරවල සන්තකය පවරා ගැනීමට හෝ අන් ක්‍රමයකින් හිඟ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කළ යුතුවේ. | ඉදිරියේ දි මුදල් අය කිරීමට හා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (iv) | පුද්ගලික සමාගමට අයත් ඩිජිටල් දැන්වීම් පුවරුවකට අදාළව අයවිය යුතු රු.940,083 ක මුදල් අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කිරීම හෝ ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාමාර්ග ගැනීම සිදු කළ යුතුවේ. | දැන්වීම ගලවා ඉවත් කිරීම සඳහා කර්මාන්ත දෙපාර්තමේන්තුවට ලිඛිතව දන්වා ඇත. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2006/03 මප/ප.පා.කො. චක්‍රලේඛය ප්‍රකාරව, බෝගම්බර වෙළඳ සංකීර්ණයේ කඩ බදු දීමේ දී, බදුකරුවන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දි ගිවිසුම්ගත වීමට කටයුතු කරමි. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩා අත්තිකාරම් මත රු.3,512,382 ක වටිනාකමක් පෙර ගෙවුම් ලෙස සැපයුම්කරුවන්ට ගෙවා තිබුණි. | සේවාව ලබා ගත් පසු ගෙවීම් කළ යුතුවේ. | කොටසක් නිරවුල් කර ඇති අතර, ඉතිරි ප්‍රමාණය ඉදිරියේ දි නිරවුල් කරමි. |

### 3.5 <u>මතභේදයට තුඩු දෙන ගනුදෙනු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ---------------------------------- |
| බෝධියංගණ මාවතේ පුද්ගලික අයිතිකරුවකුගේ ඉඩම තුළ ඉදිකිරීම් සඳහා වූ එකඟතාවය ලිඛිතව ලබා නොගෙන සභාව විසින්, රු.5,018,984 ක් වැය කර, ඉඩමේ මායිම් වෙනස් වන පරිදි ආරක්ෂක බැම්මක් ඉදිකර තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඇල්ල කැඩී යාමේ දී, මායිම සොයාගත නොහැකි වූ බැවින්, මෙම ගැටළුව පැන නැඟී ඇත. |

### 3.6 <u>වත්කම් කළමනාකරණය</u>

### 3.6.1 <u>වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | -------------- | ----------------------------------- |
| (අ) | කුලි ආදායම් අහිමි වීම<br>---------------------------<br>සභාව විසින් ග්‍රාම නිලධාරී කාර්යාල පවත්වා ගෙන යාම සඳහා ලබා දී තිබූ ගොඩනැගිලි 14 න් ලැබිය යුතු රු.129,000 ක කුලි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකළ යුතුවේ. | කුලි මුදල් නිවැරදිව හඳුනා ගෙන නොමැති අතර, ඉදිරියේ දි නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | බෝගම්බර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 42 ක් වසර 15 කට වඩා වැඩි කාලයක් වසා දමා ඇති අතර, අය විය යුතු හිඟ කඩකුලි රු.334,916 ක් ද අය කිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලි අය කිරීම හා වත්කම් ප්‍රයෝජනයට ගත යුතුවේ. | කඩ කාමර අබලන් තත්ත්වයේ පවතින බැවින්, නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇත. |
| (ඇ) | උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගුඩ්ෂෙඩ් වෙළඳ සංකීර්ණයේ කඩහිමියන් වෙත වන්දි හිමිකම් ප්‍රදානය කිරීමේ දී, සභාවට ලැබියයුතු රු.4,235,468 ක කුලි අය නොකර, වන්දි හිමිකම් ගෙවා අවසන් කර තිබුණි. | වන්දි ගෙවීම් නිවැරදි ක්‍රමවේදය අනුව, සිදු කළ යුතුවේ. | අනන්‍යතාවය තහවුරු කර ගත නොහැකි වූ බැවින්, හිඟ මුදල් අය කිරීමට නොහැකි වී ඇත. |
| (ඈ) | රජවත්ත නව වෙළඳ සංකීර්ණය මගින් අපේක්ෂිත රු.7,500,000 ක ආදායම ඉපයීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් මගින් ආදායම් ලබා ගත යුතුවේ. | තක්සේරු ලබා ගැනීම හා ටෙන්ඩර් ක්‍රියාවලිය සඳහා කාලයක් ගත වී ඇත. |

**3.6.2 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම හා කාලය සොයාගත නොහැකි භාණ්ඩ අයිතම 15 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය සඳහා ඉදිරිපත් කර ඇත. |

**3.6.3 <u>වාහන උපයෝජනය</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ දී, ධාවනය කරන කි.මී. ගණන සඳහා ගෙවීම් කරන ආකාරය පිළිබඳ කොන්දේසි විධිමත් පරිදි ගිවිසුමට ඇතුළත් නොකර, වාහන 13 ක් කුලී පදනම මත ලබා ගෙන තිබුණි. | නිවැරදි ආකාරයට ගිවිසුම් සකස් කළ යුතුවේ. | ඉදිරියේ අවශ්‍ය කොන්දේසි ඇතුළත් කර ගිවිසුම්ගත වීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3.1 ඡේදය ප්‍රකාරව, වාහන 60 කට අදාළව ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සියලු වාහන සඳහා ලොග් සටහන් පොත් ලබා දී ඇති අතර, ඉදිරියේ දි නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**3.7 <u>අවිධිමත් ගනුදෙනු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 වර්ෂයේ දේපළ හිමියාට හිමිකාරීත්වය ලැබී ඇති පර්චස් 31.5 ක් වූ කටුගස්තොට පාර, අංක 81/1 අංක දරන දේපළ සභාවේ වරිපනම් බදු ලේඛනයේ සඳහන්ව තිබිය දී, හිමිකරු දැනුවත් කිරීමකින් තොරව 2017 වර්ෂයේ දී, මෙම දේපළ පුද්ගලයින් දෙදෙනෙකුට පර්චස් 21.5 ක් හා පර්චස් 10 ක් ලෙස අයිති බවට වරිපනම් බදු ලේඛනය සංශෝධනය කිරීම හේතුවෙන්, පූර්ව හිමිකරුට සිදු වී ඇති අවාසිසහගත තත්ත්වය නිවැරදි කිරීමට සභාව නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වරිපනම් ලේඛන සංශෝධනය විධිමත් පරිදි කළ යුතුවේ. | නඩු තීන්දුව ප්‍රකාරව කටයුතු කර ඇත. |

**3.8 හඳුනාගත් අලාභ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ජල සැපයුම් කර තිබූ පාරිභෝගිකයෙකු 2015 වර්ෂයේ දී, ජල මනුවට සිදු කළ අලාභ හානි වෙනුවෙන් මනු අලාභය ලෙස රු.58,880 ක් පමණක් අය කර තිබූ නමුත්, මනු හානිය නිසා, අඩුවෙන් පෙන්වන ලද ජල පරිභෝජනය වෙනුවෙන් අය විය යුතු රු.2,495,723 ක මුදලක් අය කර නොතිබුණි. | අලාභ අයකළ යුතුවේ. | අලාභය ගණනය කර ඉදිරියේ දි අය කරමි. |

**3.9 ප්‍රසම්පාදනය**

**3.9.1 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අයිලප්පෙරුම ක්‍රීඩා පිටියේ කාණුව සැකසීම - රු.4,065,545 | | |
| | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3 වගන්තිය ප්‍රකාරව, ඉඩ දිය හැකි අවිනිශ්චිත ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.1,409,469 ක් වැය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | සංශෝධිත ඇස්තමේන්තුවක් සකස් කර ඇත. |
| (ආ) | 2018 වර්ෂයේ දී, "විශේෂ ව්‍යාපෘති ඒකකය" විසින් සිදු කරන ලද කර්මාන්ත | | |
| (i) | කර්මාන්ත 15 ක ඉටු කළ යුතු ලෙස හඳුනාගත් රු.22,939,730 ක ඇස්තමේන්තු කාර්යයන් අතුරින් රු.7,806,888 ක වටිනාකමැති කාර්යයන් ඉටු කර නොතිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව ඉදිකිරීම් කළ යුතුවේ. | ඉදිරියේ දි නිවැරදි පිළිතුරක් ලබා දීමට කටයුතු කරමි. |
| (ii) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13 වගන්තියට පටහැනිව කර්මාන්ත 06 ක ඉඩදිය හැකි විචලනය ද ඉක්මවා අනුමැතියකින් තොරව රු.3,356,841 ක වැඩ සියයට 08 සිට සියයට 66 ක පරාසයක සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දි නිවැරදි පිළිතුරක් ලබා දීමට කටයුතු කරමි. |
| (iii) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.1 හා 8.13.2 වගන්තීන් ප්‍රකාරව, කර්මාන්ත 02 ක ඇස්තමේන්තුවට පරිබාහිරව ඉදිකළ වැඩ සඳහා රු.1,460,037ක වටිනාකමක් සහිත විචලන නියෝගයක් අනුමත කර ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දි නිවැරදි පිළිතුරක් ලබා දීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | කර්මාන්ත 09 ක් සඳහා ගබඩාවෙන් ලබා ගත යුතු ද්‍රව්‍යවල වටිනාකම රු.24,052,674 ක් වුවත්, ඊට අමතරව රු.1,588,395 ක යුත් ද්‍රව්‍ය ගබඩාවෙන් ලබා ගෙන තිබුණි. | අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණයන් පමණක් ලබා ගත යුතු අතර, නිවැරදි ද්‍රව්‍ය පාලන ක්‍රමවේදයක් පවත්වා ගත යුතුවේ. | ඉදිරියේ දි නිවැරදි පිළිතුරක් ලබා දීමට කටයුතු කරමි. |
| (v) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 වගන්තිය ප්‍රකාරව, හා පළාත් පාලන කොමසාරිස්ගේ 2011 ඔක්තෝබර් 14 දිනැති චක්‍රලේඛ අංක 2/2011 ප්‍රකාරව සෘජු ශ්‍රමය යටතේ වැඩ අවසන් කර තිබූ රු.42,224,357 ක වටිනාකමින් යුත් කර්මාන්ත 32 ක් සඳහා වැඩ නිමවුම් වාර්තා පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (vi) | විශේෂ ව්‍යාපෘති ඒකකයේ මූලික අරමුණක් වන “බාහිර කොන්ත්‍රාත්කරුවන් වෙත ගලා යන ලාභය ඉතිරි කර ගැනීම” යන අරමුණ ඉටු වී ඇද්ද යන්න, කර්මාන්ත 07 ක් ගෙන සිදු කළ නියැදි පරීක්ෂාවේ දී කර්මාන්ත 03 ක් සියයට 13 සිට සියයට 73 දක්වා අලාභ ලබා තිබූ බැවින්, අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ අරමුණු ඉටු වන පරිදි කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (vii) | විශේෂ ව්‍යාපෘති ඒකකයේ ධාරිතාවය අනුව, වාර්ෂිකව ඉටු කළ හැකි කර්මාන්ත ප්‍රමාණය පමණක් නිවැරදිව හඳුනා ගෙන නොතිබූ බැවින්, 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ රු.78,327,456 ක වටිනාකමින් යුත් කර්මාන්ත 90 ක් 2019 වර්ෂය සඳහා අව්ච්ඡේද කිරීමට සිදු වී තිබුණි. | නිසි අධීක්ෂණයක් යටතේ අත්‍යවශ්‍ය කර්මාන්ත පමණක් ක්‍රියාත්මක කළ යුතුවේ. | විශාල කර්මාන්ත ප්‍රමාණයක් පවතින බැවින්, ඉදිරි වර්ෂයේ අවසන් කිරීම සිදු වේ. |
| (ඇ) | කලාප 04 කාර්යාල ගොඩනැගිල්ල<br>--------------------------------------- | | |
| (i) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 ඡේදය අනුව, ලංසුකරු අතාත්වික අඩු අනු ප්‍රමාණයන් (Rate) සඳහන් කර ඇත්නම්, ඒ සඳහා මිල ගණන් විශ්ලේෂණයක් හා ඉහළ වටිනාකමකින් යුත් කාර්යයසාධන සුරක්ෂණයක් ලබා ගත යුතු වුවත්, ඊට පටහැනිව ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 30 ක් අඩුවෙන් ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරුගේ ලංසුව පිළිගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | අමතර කාර්යසාධනයක් ලබා ගැනීම පිළිබඳ කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | ICTAD Publication No – SCA/05 පිරිවිතරයෙහි ඡේද අංක 1001.7 අනුව, කොන්ක්‍රීට් සඳහා ගෙවීම් සිදු කිරීමට පෙර සම්පිණ්ඩණ පරීක්ෂණ වාර්තාවන් ලබා ගත යුතු වුවත්, එම වාර්තාව නොමැතිව පළමු අන්තර් බිල් පත්‍රය මඟින් කොන්ක්‍රීට් ඝණ මීටර් 35.49 ක් සඳහා රු.687,015 ක් ගෙවා තිබුණි. | ICTAD මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | තත්ත්ව පරීක්ෂණ ලබා ගැනීමට කටයුතු කරමි. |
| (iii) | අමතර වැඩ සඳහා විචලතා නියෝග අනුමත කර ගැනීමකින් තොරව රු.108,920 ක් පළමු අන්තර් බිල මඟින් ගෙවා තිබුණි. | අනුමැතිය ලබා ගත යුතුවේ. | අමතර වැඩ සඳහා අනුමැතිය ලබා ගන්නා ලෙස කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කර ඇත. |
| (ඈ) | වැලිකන්ද ප්‍රජා ශාලාවට යන මාර්ගයේ නාය ගිය ස්ථානයේ රඳවුම් බැම්ම ඉදිකිරීම<br>---------------------------------------------- | | |
| (i) | කර්මාන්තය සඳහා මූලික ඇස්තමේන්තුව සකස් කිරීමේ දී, වැර ගැන්වීම් කි.ග්‍රෑ.235.5 ක් සඳහා යෝග්‍ය නොවන ආකාරයකට රු.73,555 ක් වෙන් කර තිබුණි. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේ දි නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ඉහත කර්මාන්තයට අදාළ Distribution bar, Main bar, සහ Lapping සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා කම්බි වෙනුවෙන් රු.84,530 ක් වැඩිපුර ගෙවා තිබුණි. | නිවැරදිව ගෙවීම් සිදු කළ යුතුවේ. | වැඩි පුර ගෙවූ මුදල් අය කර ඇත. |
| (iii) | ඇස්තමේන්තු ප්‍රකාරව, භාවිතා කළ යුතු කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණ සඳහා රු.10,000 ක් වෙන් කර තිබුණ ද, තත්ත්ව පරීක්ෂණයකින් තොරව කොන්ක්‍රීට් ඝන මීටර් 28.20 ක් සඳහා රු.626,040 ක් ගෙවා තිබුණි. | තත්ත්ව පරීක්ෂණ සිදු කළ යුතුවේ. | තාක්ෂණික වාර්තා ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ඉ) | කලාප කාර්යාල ඉටු කළ කර්මාන්ත<br>---------------------------------------- | | |
| (i) | 2019 වර්ෂය තුළ ඍජු ශ්‍රමය යටතේ ඉටු කළ කර්මාන්ත 13 කට අදාළ වැඩ පත්‍රිකා සඳහා ඇස්තමේන්තුව ප්‍රකාරව අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණයට වඩා රු.1,155,079 ක ද්‍රව්‍ය ගබඩාවෙන් ලබා ගෙන තිබුණි. | අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය පමණක් නිකුත් කළ යුතුවේ. | වර්තමානය වන විට නිවැරදි කර ඇත. |
| (ii) | කර්මාන්ත අංශය මඟින් කලාප 01, 02, 03, 04 හා 05 හි ක්‍රියාත්මක කළ නඩත්තු වැඩසටහන සඳහා රු.44,744,293 ක් වියදම් දරා ඇතත්, ඉටු කළ වැඩ සඳහා වැඩ නිමවුම් වාර්තා පිළියෙල කර නොතිබුණි. | වැඩ නිමවුම් වාර්තා පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේ දි පිළියෙල කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2019 ජනවාරි 25 දිනැති නාගරික ඉංජිනේරුගේ ලිපිය පරිදි Ready Mix Concrete පිරිවිතර Slum Test 125 ± 25 mm වන බව හා සෑම ඝන මීටර් ($m^3$) 15 ක් සඳහාම Concrete Strength දින 28 ක් ඇතුළත පරීක්ෂා කර 20 N පැවතීම පිළිබඳ සැපයුම්කරු විසින් වැඩ බිම පරීක්ෂා කිරීමට අදාළ වාර්තා ලබා දිය යුතු වුවත්, එසේ පරීක්ෂා කිරීමකින් තොරව කලාප තුළ රු.2,274,000 ක වටිනාකමක් සහිත Ready Mix Concrete ඝණ මීටර් 167.25 ක් භාවිතා කර තිබූ බැවින්, අදාළ ඉදිකිරීම්වල ප්‍රමිතිය පිළිබඳ ගැටළුසහගත තත්ත්වයක් පැවතුණි. | තත්ත්ව පරීක්ෂණයක් සිදු කළ යුතුවේ. | ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා කර සහතික ලබා දෙනු ලැබේ. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොලත් විගණන විමසුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | -------------- | ---------------------------------- |
| (අ) | 2018 – 3.2(ආ) - පෞද්ගලික ඉන්ධන පිරවුම්හලකට ලබා දී ඇති ජල සැපයුම මඟින් සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.399,530 ක හිඟ ජල ගාස්තු අය කර නොතිබූ අතර, ජල සැපයුම විසන්ධි කිරීම හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කළ යුතුවේ. | කොටස් වශයෙන් අය කරනු ලබයි. |
| (ආ) | 2018 – 3.2(ඇ) - ඉදිකිරීම් අනුමැතිය නොලැබූ ගොඩනැගිල්ලක් සඳහා ව්‍යාජව ඉදිරිපත් කළ සැලැස්මට මහා නගර සභාව සංවර්ධන බලපත්‍රයක් නිකුත් කර තිබූ අතර, ගොඩනැගිලි සැලැස්මට නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ද නොතිබූ බැවින්, ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | සැලැස්ම අනුව ඉදිකිරීම් අධීක්ෂණය කළ යුතුවේ. | නඩුවක් විභාග වෙමින් පවතී. |
| (ඇ) | 2018 – 3.8(අ) - පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් අධ්‍යාපන සහතික වංචනික ලෙස වෙනස් කර ඉදිරිපත් කිරීම සනාථ වී තිබිය දී, ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකර, යථෝක්ත නිලධාරිනිය පවුල් සෞඛ්‍ය සේවයේ II පන්තියට උසස් කර, 2008 ජනවාරි 01 දින සිට 2017 ජූලි 31 දින දක්වා රු.3,130,652 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. මේ | මූලික විමර්ශණ සිදු කළ යුතුවේ. | මූලික විමර්ශණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් මධ්‍යම පළාත් පාලන කොමසාරිස් විසින් මූලික විමර්ශණයක් සිදු කිරීමට නාගරික කොමසාරිස් වෙත යොමු කර තිබූ නමුත්, 2018 ඔක්තෝබර් 31 දිනය වන විටත් එකී මූලික විමර්ෂණය සිදු කර නොතිබුණි. | | |
| (ඇ) | 2018 – 3.8(ඇ) - කටුගස්තොට ජල නළ එළීමේ ව්‍යාපෘතිය සඳහා අදාළ ද්‍රව්‍ය පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකාවෙන් බැහැරගත කිරීම සඳහා නිවාඩු ඉල්ලුම් කිරීමේ දී පිටරට තමාගේ නඩත්තු වියදම් කොන්ත්‍රාත්කරු විසින් සපයන බවට විෂයභාර අමාත්‍යවරයා හා ආණ්ඩුකාරවරිය වෙත ව්‍යාජව කරුණු දක්වා විදේශ ගමන අනුමත කරවා ගෙන ඇතත්, විදේශගත වීමේ සියලු වියදම් සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුවේ අයිතම අංක 1.3 යටතේ රු.1,500,000 ක මුදලක් ඇතුළත් කර 2018 අප්‍රේල් 04 දින කොන්ත්‍රාත්කාර ආයතනයට මහා නගර සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි. | ගෙවීම් කිරීමට පෙර නිවැරදි සියලු කරුණු සලකා බැලිය යුතු වේ. | තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා දීමේ දී මෙම ද්‍රව්‍ය පරීක්ෂාව අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු කාර්යයක් බව ප්‍රකාශ කරමි. |